සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

14 - 7 - 2024

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

St. Mazenod College
Kandana
9050

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 යි |

නම / பெயர் / Name ............................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ............................

# I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අංක 1 සිට 20 දක්වා ප්‍රශ්න අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) පුරාණ ගිවිසුමට අයත් දිවැසිවර ග්‍රන්ථයක් වන්නේ මින් කුමක්ද ?
1. ජෝනා 2. ප්‍රඥාව 3. නෙහෙමියා 4. එස්රා

02) නව ගිවිසුමේ එළිදරව් සාහිත්‍යයට අයත් ග්‍රන්ථයක් වන්නේ,
1. දානියෙල් 2. ජෝබ් 3. එළිදරව්ව 4. තෝබිත්

03) සියොන් යනුවෙන් හැඳින්වෙන්නේ
1. ගලීලය 2. ජෙරුසලම 3. පලස්තීනය 4. බෙතෙල්

04) "රෝමයේ නිරෝ අධිරාජ්‍යයාගේ පීඩනයට ලක් වූ කිතුනුවන් දිරිමත් කිරීමට" රචනා වූ සුභාරංචි ග්‍රන්ථය වන්නේ,
1. ලූක් ශුභාරංචිය 2. ජොහන් ශුභාරංචිය 3. මතෙව් ශුභාරංචිය 4. මාක් ශුභාරංචිය

05) ජොහන් ශුභාරංචියේ අඩංගු 'මම වෙමි' ප්‍රකාශනයක් වන්නේ,
1. බැටළුවන්ට දොරටුව මම වෙමි
2. මම යහපත් නායකයා වෙමි
3. සැබෑ මිදිවැලෙහි අතු මම වෙමි
4. මාර්ගය ද සත්‍යය ද අවබෝධය ද මම වෙමි

06) දෙවියන් වහන්සේට අකීකරු වූ ආදම් සහ ඒව ට අනුකම්පා කර දෙවියන් වහන්සේ ඔවුන්ට ............................ පොරොන්දුවක් දුන් සේක. හිස්තැන්වලට වඩාත්ම සුදුසු පිළිතුර වන්නේ,
1. ආදරයේ 2. බලාපොරොත්තුවේ 3. නිහතමානී 4. විමුක්තියේ

07) 'නුඹ අයහපත කරන්නෙහි නම් පාපය රකුසකු සේ නුඹේ දොරකඩ ලැග සිටින්නේය' මෙය කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද?
1. දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයාට
2. නෝවා විසින් සිය දරුවන්ට
3. සමිඳාණන් වහන්සේ විසින් කායින්ට
4. දෙවියන් වහන්සේ විසින් ආදී මව්පියන්ට

08) පුරාණ ගිවිසුමේ දේදුන්න මගින් සංකේතවත් වන්නේ,
1. දේව අනුකම්පාව, කරුණාව හා ප්‍රේමය
2. පාපය මතක් කිරීම, ප්‍රේමය හා දයාව
3. දේව ආදරය, මිත්‍රත්වය හා කරුණාව
4. එකමුතුකම, බැඳීම හා සිහිපත් කිරීම

09) ජුදා ජනතාව ආරක්ෂා කර ගැනීමට දෙවියන් වහන්සේ විසින් පත් කරන ලද්දේ,
1. රජවරු 2. වීර නායකයන් 3. සාමුවෙල් 4. ජේසුස් වහන්සේ

10) රතු පැහැයක් ද කඩවසම් පෙනුමක් ද දීප්තිමත් නෙත් යුවලක් ද ඇති අයෙකුට සාමුවෙල් විසින් තෙල් කුලාව රැගෙන රජ ලෙස අභිෂේක කරන ලද්දේ,
1. සලමොන් 2. සාවුල් 3. සාමුවෙල් 4. දාවිත්

11) මුල් අගුණ පවක් වූ 'රාගය' නැති කර ගන්නට දියුණු කර ගත යුතු ධර්ම ගුණය වන්නේ,
1. ත්‍යාගිවන්තකම 2. බ්‍රහ්මචර්යාව 3. බැගෑපත්කම 4. ප්‍රේමය

12) මෝසෙස්තුමාගේ නීතිය අනුව කාමමිථ්‍යාචාරය කළ අයට හිමි වන දඬුවම වන්නේ,
1. ගල්ගසා මරා දැමීම
2. කුරුසියේ දඬුවම
3. සමාජයෙන් කොන් කිරීම
4. අධිකරණයට ගෙන යාම

13) 'පමා වී ඇතැයි සමහරුන් සිතන නමුත්, ස්වාමීන් වහන්සේ සිය පොරොන්දු ඉටු කිරීමට පමා වී නැත' මෙලෙස සඳහන් වන ග්‍රන්ථය වන්නේ,
1. ජොහන් 2. 2 පේදුරු 3. හිතෝපදේශය 4. 1 පේදුරු

14) අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම් අනුව රෝගීන් ආලේප කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
1. ගෝලයින් 2. පාප්තුමා 3. රදගුරුතුමන්ලා 4. පූජාප්‍රසාදීන් වහන්සේලා

15) රෝගීන් ආලේප කිරීමේ පිළිවෙතට පෙර පූජාප්‍රසාදීතුමා රෝගියාගෙන් අසනු ලබන්නේ,
1. සුවදුක් 2. පරණ මතකයන් 3. පාපොච්චාරණය 4. ස්වර්ග රාජ්‍යය පිළිබඳව

16) '.................. දෙවියන් වහන්සේගෙන්ම ලද නිසා ඒ සඳහා සාධාරණ සැලකිල්ලක් දැක්වීම අප සැමගේ යුතුකමකි' මෙහි හිස්තැනට වඩාත් ම සුදුසු පිළිතුර වන්නේ
1. ජීවිතයත්, ශරීරයත්
2. මරණයත් කැමැත්තත්
3. ආත්මයත්, යාච්ඤාවත්
4. යාච්ඤාවත්, දේව කැමැත්තත්

17) අපගේ හොඳම කාලය දෙවියන් වහන්සේට පූජා කිරීමට අප විසින් කළ යුතු වන්නේ,
1. දිනපතා පුරුද්දක් ලෙස දේවස්ථානයට යාම
2. දිනපතා අවධි වූ විගස යාච්ඤා කිරීමය
3. දේව ආදරයට අපගේ ජීවිතය විවෘත කිරීමය
4. අපගේ ආදරය දෙවියන් වහන්සේ හමුවේ තැබීමය

18) 'ශරීරය අනාචාරය පිණිස නොවේ. එය සමිඳාණන් වහන්සේ උදෙසාය' මෙලෙස සඳහන් වන්නේ,
1. 1 කොරින්ති 2. 1 පේදුරු 3. 2 ජොහන් 4. ජුද්

19) පාපයෙන් මිදීමට අපට අවශ්‍ය වන්නේ කුමක් ද?
1. දේව ආදරය හා කරුණාව
2. දෙවිඳුන්ගේ අසීමිත සමාව
3. ශුද්ධාත්ම දීමනා හා ඵල
4. ශුද්ධාත්ම වරප්‍රසාද හා බලය

20) 'අහෝ කොතරම් අලංකාර දර්ශනයක් දැන් මට පෙනේ ද' මෙලෙස පවසා මරණයට පත් වූ පුද්ගලයා වන්නේ,
1. තෙරේසා මව්තුමිය
2. ශු. මරියා ගොරෙත්ති මුනිතුමිය
3. ශු. දොමිනික් සාවියෝ මුනිතුමා
4. ශු. ඇග්නස් මුනිතුමිය

(ලකුණු 2 × 20 - 40)

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. ශුද්ධ බයිබලය පිළිබඳව ඇති දැනුම තුළින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  i. ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ ඇති පොත් හතළිස් හය බෙදා වෙන් කළ හැකි කාණ්ඩ 4 ක් නම් කරන්න. (ලකුණු 4)
  ii. නව ගිවිසුම තුළ දක්නට ලැබෙන සංදේශ විසිඑක අතරින් ඔබ කැමති සංදේශ 4 ක් නම් කරන්න. (ලකුණු 4)
  iii. ගීතාවලිය නිර්මාණය වී ඇත්තේ කාණ්ඩ පහක එකතුවකිනි. එහි සඳහන් කාණ්ඩ 3 ක් නම් කරන්න. (ලකුණු 3)
  iv. මාක් ශුභාරංචිය රචනා වීමට හේතු වූ අරමුණ නම් කරන්න. (ලකුණු 1)
  v. ජොහන් ශුභාරංචිය ලිවීමේ අරමුණු 2ක් නම් කරන්න. (ලකුණු 4)

02. i. ආදම් සහ ඒව ඒදන් උයනෙ පදිංචි කරවීමෙන් පසු දෙවියන් වහන්සේ ඔවුන්ට දුන් අවවාදය කුමක්ද? (ලකුණු 3)
  ii. වරදට වැටුණු කායින්ට දෙවියන් වහන්සේ දුන් දඬුවම් 3 ක් නම් කරන්න. (ලකුණු 3)
  iii. අන් අයගේ යහපත වෙනුවෙන් ක්‍රියා කළ හැකි ආකාර 5 ක් ලියන්න. (ලකුණු 5)

3. i. මුල් අගුණ පව් නැති කර ගැනීමට දියුණු කර ගත යුතු ධර්ම ගුණ 3 ක් නම් කරන්න. (ලකුණු 03)
  ii ශුද්ධාත්මයාණන් වහන්සේට විරුද්ධව කරන පව් 3ක් නම් කරන්න. (ලකුණු 03)
  iii. පාපොච්චාරණය කිරීමේ පිළිවෙත ලියා දක්වන්න. (ලකුණු 05)

04. i. රෝගීන්ගේ ආලේපය නම් දේව ප්‍රසාද නිධානය ලැබිය හැකි පුද්ගල කණ්ඩායම් 3 ක් නම් කරන්න. (ලකුණු 3)
  ii. පූජාප්‍රසාදීන් වහන්සේ පැමිණීමට පෙර රෝගියා සිටින ස්ථානය හා රෝගියාව සූදානම් කිරීමට කළ යුතු දේවල් 3 ක් ලියන්න. (ලකුණු 3)
  iii. රෝගී පුද්ගලයන් බලන්නට ගොස් කිව හැකි යාච්ඤාවක් ලියන්න. (ලකුණු 5)

05. i. තම ජීවිතය සුරැකීමට කළ හැකි කාර්යයන් 3 ක් ලියන්න. (ලකුණු 3)
  ii. අන් ජීවිත සුරැකීමට ඔබට කළ හැකි දේවල් 3 ක් ලියන්න. (ලකුණු 3)
  iii. 'අහිංසකයන් පමණක් නොව වරදකරුවන් පවා ඝාතනය නොකළ යුතුය' මෙලෙස දෙවියන් වහන්සේ ක්‍රියා කළ බවට දැක්වෙන උදාහරණයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

06. i. 6 සහ 9 පණත් දෙක නම් කරන්න. (ලකුණු 2)
  ii. පාරිශුද්ධ ජීවිතයක් ගත කිරීමට කළ යුතු දේවල් 4 ක් ලියන්න. (ලකුණු 4)
  iii. පිවිතුරු ජීවිතයක් ගත කිරීමට ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න. (ලකුණු 5)

07. i. ශුද්ධ බයිබලයේ නව ගිවිසුම් තුළ දක්නට ලැබෙන උදාන ගී 3 ක් නම් කරන්න. (ලකුණු 3)
  ii. ක්‍රිස්තියානි සම්ප්‍රදාය තුළ ඇති යාච්ඤාවේ ප්‍රභේද 3ක් නම් කරන්න. (ලකුණු 3)
  iii. 'ප්‍රීතිමත් අවස්ථාවලදී දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ යුතුය' මේ පිළිබඳව ඔබේ අදහස් වචන 50 කින් පමණ පැහැදිලි කරන්න. (ලකුණු 5)